# 2025 සැප්තැම්බර් මස මාසික සභා රැස්වීම් වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව
දිනය - 2025.09.25
වේලාව - පෙ.ව. 10.00
පැමිණීම

| | නම | | තනතුර |
|---|---|---|---|
| I. | එච්.එල්.ජයසිරි | - | ගරු සභාපති |
| II. | ආර්.රජිත් ප්‍රියදර්ශන | - | ගරු උපසභාපති |
| III. | හර්ෂ උදයකුමාර ජයවීර | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| IV. | ආර්.කේ.එම්.රෝහිත | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| V. | එම්.එල්.එම්.හනීෆා | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VI. | කේ.රත්න | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VII. | එම්.ඒ.ආරියසේන | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VIII. | පී.එම්.පී.අනුර ප්‍රියන්ත | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| IX. | එම්.එල්.එම්.අසාර් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| X. | බී.කේ.නිලුකා කුමුදුනී | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XI. | ආර්.ඩබ්ලිව්.සිරිසේන | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XII. | කේ.ජී.තමිලා දිල්රුක්ෂි | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIII. | සුදත් චමින්ද උයනගේවා | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIV. | බී.ඩී.නිපුන ශයාශාන් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XV. | එස්.දයාසේන | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVI. | එල්.වයි.තුවන් චතුරංග | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVII. | ජේ.ඒ.තනුජා දිලානි | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVIII. | උදානි ලියනගේ | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIX. | එල්.ඒ.සුනිල් පියංකර | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XX. | ඩබ්ලිව්.පී.පුජිවා නිල්මිණි | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XXI. | එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

නොපැමිණීම :- ---

| | නම | | තනතුර |
|---|---|---|---|
| XXII. | එන්.ටී.චමින්ද ජයනාත් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව,ගරු සභාපති , එච්.එල්.ජයසිරි මහතා විසින් 2025 වර්ෂයේ සැප්තැම්බර් මස මාසික සභාව පැවැත්වෙන අද දින පැමිණ සිටින ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්,ලේකම්තුමිය හා මාධ්‍යවේදී ඒ.ඒ.ප්‍රේමසිරි මහතාත් , රුක්මන් රත්නායක මහතා ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

(අ) 2025.08.21 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.

2025.08.21 වන දිනැති මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන බව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා යෝජනා කළ අතර , එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදි.

(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන. - නැත
(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන.-නැත
(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

➢ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.වයි.නුවන් චතුරංග මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

I. කිරින්දගම ප්‍රථමික විදුහලට හා පොලට ගමන් කරන මාර්ගය ඉතා අබලන්ව ඇති අතර එම මාර්ගය භාවිතා කරන ගුරුවරුන්,සිසුන් ,දෙමාපියන් මේ හේතුවෙන් දැඩි අපහසුතාවයට පත්වෙති.තවද මෙම මාර්ගය පොළ භූමියට ද, ක්ලිනික් මධ්‍යස්ථානයට හා විහාරස්ථානයට ද යාමට ගමේ ජනතාව යොදාගන්නා මාර්ගයකි.තවදුරටත් මෙම තත්වය පැවතුනහොත් මෙම මාර්ගයේ පා ගමනින් යාම හැර කිසිදු වාහනයකට හෝ යතුරුපැදියකට ගමන් කිරීමට නොහැකිවනු ඇත.මෙම කරුණු සලකා බලා මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

❖ අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා

ග්‍රාම සංවර්ධන සමිති යටතේ මෙම මාර්ගයේ කොටසක් සංවර්ධනය කිරීමට නියමිත බවට ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබලිව්.පී.පුජිතා නිල්මිණි මහත්මිය විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

II. කිරින්ද ප්‍රාථමික පාසල අසල ඇති සර්වෝදය මධ්‍යස්ථානය පෞද්ගලික ව්‍යාපාර කටයුතු සඳහා අත්පත් කරගෙන ඇති අතර මේ හේතුවෙන් එම ගොඩනැගිල්ල කිසිදු පොදු කටයුත්තක් සඳහා නොහැකි වී ඇත. දරුවන්ට අමතර උපකාරක පන්ති පැවැත්වීම, ළමා සමාජ පැවැත්වීම, සමිති සමාගම් පවත්වාගෙන යාම ආදී කටයුතු වලට මෙම මධ්‍යස්ථානය ලබාගැනීමට නොහැකි වී ඇත.මෙය පිළිබඳව අධීක්ෂණය කොට සොයා බලා කඩිනමින් මෙයට විසඳුමක් ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

❖ අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා

මෙ සම්බන්ධයෙන් කටයුතු කිරීමට නීතිමය හැකියාවක් සභාව වෙත නොමැති බවත්, සර්වෝදය ආයතනය සමඟ සාකච්ඡා කර, ඉඩම් පරිහරණ කමිටුවේ දී තීරණයක් ගැනීම සඳහා යොජනා වී ඇති බව ප්‍රකාශ කරන ලදි.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා

රජය විසින් ලබා දුන් ගොඩනැගිල්ලක් නොවන බවට ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ.තනුජා දිලානි මහත්මිය විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

III. කිරින්දගම පොළ භූමිය අසල ඇති සෞඛ්‍ය මධ්‍යස්ථානය කුඩා දරුවන්ගේ බර කිරන කටයුතු ආදියට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිතුමියන් භාවිතා කරන ස්ථානයකි.නමුත් මේ වන විට එම

මාධ්‍යස්ථානය අබලන්ව ඇති අතර බර කිරා ගැනීමේ කටයුතු සඳහා පොල භූමියේ වෙළඳසැල් වල ලෑලි පවා යොදා ගැනීමට සිදු වී ඇත.ඉහත කරුණු පිළිබඳ සලකා බලා එම සෞඛ්‍ය මධ්‍යස්ථානය පිළිසකර කර දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට නීතිමය හැකියාවක් සභාව වෙත නොමැති බවත්, මෙහි නීතිමය හිමිකම පවතින්නේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය වෙත බැවින් මේ සම්බන්ධයෙන් අදාළ ආයතනය වෙත දන්වා යැවීමට හැකියාවක් පවතින බව ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා.

➤ <u>ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

➤ <u>මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මගින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

01.<u>වරිපනම් දේපළ භෞතිකව නොමැති හෝ එම දේපළයෙහි ව්‍යාපාරයක් සිදු නොකරනු ලබන දේපළෙහි ස්වභාවය වෙනස් වූ, අය කර ගත නොහැකි හිඟ ශේෂ පවතින වරිපනම් දේපළ 09 හි පවතින හිඟ මුදල කපා හැරීම සඳහා වූ යෝජනාව</u>

වරිපනම් දේපළ භෞතිකව නොමැති හෝ එම දේපළයෙහි ව්‍යාපාරයක් සිදු නොකරනු ලබන දේපළෙහි ස්වභාවය වෙනස් වූ, අය කර ගත නොහැකි හිඟ ශේෂ පවතින වරිපනම් දේපළ 09 ක් සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂක නිලධාරි ලබා දී ඇති වාර්තාවට අනුව, එකී දේපළ 09 හි 2024.09.30 දිනට පවතින හිඟ ශේෂය වන රු. 137,813.43 ක මුදල කපා හැරීමටත්, ඉදිරි බිල් කිරීම් නතර කිරීමටත් 2025.08.11 වන දින පැවැති මුදල් කමිටුවේ යෝජනා අංක 12 යටතේ නිර්දේශය ලබා දී ඇත.

එලෙස මුදල් කමිටු නිර්දේශය ලබා ගන්නා ලද, භෞතිකව නොමැතිව පවතින පහත සඳහන් දේපළ 09 හි 2024.09.30 දිනට පවතින හිඟ මුදල වන රු. 137,813.43 ක මුදල කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරීමත්, ඉදිරි බිල් කිරීම නතර කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | දේපළ අංකය | නම | දේපළ විස්තරය | වාර්ෂික වරිපනම් බදු වටිනාකම | භෞතිකව නොමැති කාල සීමාව | 2024.09.30 හිඟ මුදල | හිඟ මුදල පවතින වසර ගණන |
|---|---|---|---|---|---|---|---|
| 01 | 13/1 | පී.එල්. මුබාරි/ (භි.ක) පී.ඒ. සිරිවර්ධන | තහඩු හා පොල් අතු සෙවිලි බේකරිය | 500.43 | වසර 14 ක පමණ සිට | 12,999.61 | වසර 21 ක් පමණ |
| 02 | 75/1 | ඒ.පී. නන්දසිරි | තහඩු හා ඇස්බැස් ටෙල්ටා සෙවිලි පොල්තෙල් සිඳින ස්ථානය | 400.33 | වසර 15 ක පමණ සිට | 10,474.79 | වසර 22 ක් පමණ |
| 03 | 10C | එස්.එම්. බබුන් අප්පුහාමි / (භි.ක) කපිල සිරිවර්ධන | තහඩු සෙවිලි ගරාජ් වැඩපල | 667.24 | වසර 14 ක පමණ සිට | 9,975.41 | වසර 12 ක් පමණ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 04 | 29 | ශ්‍රී.පුෂ්පමාල | ඇස්බැස්ටස් සෙවිලි හාල් මෝල | 3,665.41 | වසර 15 ක පමණ සිට | 22,358.94 | වසර 05 ක් පමණ |
| 05 | 364 | නිමල් ධර්මප්‍රිය එදිරි වික්‍රමසූරිය | තහඩු සෙවිලි හාල් මෝල | 2,181.90 | වසර 11 ක පමණ සිට | 21,255.37 | වසර 08 ක් පමණ |
| 06 | 479A | ඩබ්.පී. ඇලිස්නෝනා (මියගියකරු) / (නි.හ)එස්.පී. පොඩිනෝනා | උළු සෙවිලි හාල් මෝල | 1,261.19 | වසර 15 ක පමණ සිට | 24,928.75 | වසර 16 ක් පමණ |
| 07 | 610 | රජය / (නි.හ) කේ.පී. උපේද්නිස් | උළු සෙවිලි නිවස | 233.52 | වසර 09 ක පමණ සිට | 13,143.92 | වසර 22 ක් පමණ |
| 08 | 719/6 | අයිතිකරු | ඇස්බැස්ටස් සෙවිලි ගොඩනැගිල්ල | 1,000.93 | අයිතිකරුවකු සොයා ගැනීමට නොහැකි නිසා, භෞතිකව නොමැති කාල සීමාව සඳහන් කළ නොහැක | 16,752.62 | වසර 14 ක් පමණ |
| 09 | 66B | එච්.කේ. සදුන් රත්න කැලුම්/ එච්.කේ. රුවන් රත්න කැලුම් | ඇස්බැස්ටස් සෙවිලි වැල්ඩින් වැඩපල | 250.18 | වසර 08 ක පමණ සිට | 5,924.02 | වසර 20 ක් පමණ |
| හිඟව පවතින මුළු මුදල | | | | | | 137,813.43 | |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

02. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ කාර්යයන් සඳහා දරන ලද රු.100,000.00 වැඩි වැය කිරීම සඳහා ගෙවීම කිරීම සඳහා වූ යෝජනාව</u>

2025-09-04 දිනයන්හි පැවති මුදල් කමිටු සඳහා ඉදිරිපත් කරන ලද රු.100,000.00 ට වැඩි ගෙවීම් සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ආයතනය | විස්තරය | බිල්පත් අංකය හා දිනය | මුදල |
|---|---|---|---|---|
| 01 | සෝමසිරි ස්ටෝර්ස් | ආදාහනාගාරය සඳහා ගෑස් මිලදී ගැනීම | MIV44898 - 25.08.25 | 160,316.97 |
| 02 | දක්ෂිණ ටයර් වර්ක්ස් | කට්ටුව සඳහා 8-10 රෝල ප්‍රවාහනය | 462 | 174,320.00 |
| 03 | පී.හර්ෂණ | යාන්ත්‍රික වැඩපල සේවය කිරීම සඳහා ගෙවීම - අගෝස්තු මස | | 118,900.00 |
| 04 | බී.යූ.කේ. සංජය | යාන්ත්‍රික වැඩපල සේවය කිරීම සඳහා ගෙවීම - අගෝස්තු මස | | 118,900.00 |
| 05 | බී.ආර්. රේණුකා | 2025 වර්ෂයට පෙර පාසල් ළමුන් සඳහා නිල ඇඳුම් මැසීම වෙනුවෙන් ගෙවීම | | 234,600.00 |
| 06 | දිදුල අයන් වර්ක්ස් | වාර්ෂික නිල ඇඳුම් දීමනාව ලබාදීම සඳහා අවශ්‍ය ගම් බූට්ස් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | | 104,965.00 |

| | | | | |
|---|---|---|---|---|
| 07 | දිදුල අයන් වර්ක්ස් | තණකොළ කපන මැෂින් සඳහා අවශ්‍ය කොටස් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | | 115,250.00 |
| ආවරණ අනුමැතිය යටතේ ගෙවීම් විස්තරය | | | | |
| 08 | ඉරේෂා ඉන්ධන පිරවුම්හල | සභාව සතු රථවාහන සඳහා ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම | | 799,654.50 |
| 09 | ලේකම් | දෛනික රාජකාරී කටයුතු සඳහා යොදාගන්නා සේවකයින්ට ගෙවීම - ජූලි මස | | 197,000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.දයාසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

03. <u>කාර්යාලීය උපකරණ වන පරිගණක, මුද්‍රණ යන්ත්‍රය සහ ලැප්ටොප් පරිගණක මිළට ගැනීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශිය සභාවේ කාර්යාලීය කටයුතු විධිමත් කරගැනීම වෙනුවෙන් පහත සඳහන් කාර්යාලීය උපකරණ මිළට ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කර තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කරන ලදි. ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් විසින් වාර්තාව සකස් කර ලබා දී ඇත. ඒ අනුව පහත පරිදි මුදලක් එම මිලදී ගැනීම කටයුතු සඳහා වැය වන අතර, මිලදී ගැනීම සඳහා නිර්දේශ ලබා ගැනීමට මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා නිර්දේශය හිමිවී ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| උපකරණය | ප්‍රමාණය | ඒකක මිල | 18 % Vat | මුළු මුදල(රු) |
|---|---|---|---|---|
| පරිගණක | 08 | 233,960.00 | 42,112.80 | 2,208,582.40 |
| මුද්‍රණ යන්ත්‍රය | 02 | 43,800.00 | 7,884.00 | 103,368.00 |
| ලැප්ටොප් පරිගණක | 01 | 210,000.00 | 37,800.00 | 247,800.00 |
| | | | | 2,559,750.40 |

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

04. <u>කසළ සෝධනයට අදාළ අතුරු ව්‍යවස්ථාව වැලදගෙන ප්‍රකාශයට පත් කිරිමෙන් අනතුරුව ක්‍රියාත්මක සඳහා වූ යෝජනා</u>

2025 වර්ෂයට ව්‍යාපාරික ස්ථාන වලින් කසළ ඉවත් කිරිමේ ගාස්තු පැනවීමේදි එම ගාස්තු අය කිරිමට අදාළ නෛතික බලය නිශ්චිතව දක්වා නොමැත.එසේ වුවද අංක 520/7 හා 1988.08.23 දිනැති අමාත්‍ය වරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද අතුරු ව්‍යවස්ථා මාලාවේ 09 වන අතුරු ව්‍යවස්ථාව වන කසළ සෝධනයට අදාළ අතුරු ව්‍යවස්ථාව සභාවට අදාළ කර ගැනීමට නෛතික බාධාවක් නොමැත.එසේ වුවද ඊට අදාළ 2013.05.17 දින පළාත් පාලන විෂය භාර අමාත්‍ය වරයා විසින් 2013.10.25 දින ප්‍රකාශයට පත් කරන ලද 1834 දරණ අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව කසළ සෝධන ගාස්තු සභාවට අය කර ගැනීමට හැකියාව පවති. නමුත් එම අතුරු ව්‍යවස්ථාව මේ දක්වා සභාව විසින් වැළදගෙන නොමැති බැවින් එම අතුරු ව්‍යවස්ථා මාලාව සභාව වැළද ගැනිමෙන් පසුව ඊට අදාළව 2026 වර්ෂයට ඝණ අප ද්‍රව්‍ය ගාස්තු පනවා අය කිරිමට නීතිමය හැකියාව පවති.

එම අතුරු ව්‍යවස්ථාව අප්‍රමාදව වැළදගෙන ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව දැනට මෙම සභාව අය කරනු ලබන ගාස්තු වලට වඩා සාධාරණ හා ප්‍රමාණවත් ගාස්තුවක් ඒ ඒ ව්‍යාපාරික ස්ථාන වලට අදාළව බැහැර කරන ඝණ අපද්‍රව්‍ය ප්‍රමාණයට අනුකූලව අය කර ගැනීමෙන් සභාවේ ආදායම් මට්ටම ඉහල නංවාලීමට හැකියාවක් පවතින බැවින් එම අතුරු ව්‍යවස්ථාව වැළදගෙන ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව ක්‍රියාත්මක කිරීමට සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

05.2026 වර්ෂයයේ ටෙන්ඩර් කමිටුව සඳහා සාමාජිකයින් පත් කිරීම සම්බන්ධයෙන් වූ යෝජනාව

2026 වර්ෂයයේ ටෙන්ඩර් කමිටුව සඳහා දැනට පවතින ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයින් හෝ වෙනත් සාමාජිකයින් පත් කිරීම සම්බන්ධ තීරණය කිරීම සඳහාත්, ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

- අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා

2026 වර්ෂයයේ ටෙන්ඩර් කමිටුව සඳහා තමන්ගේ නම ද ඇතුළත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රත්න මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

06.තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් දේපල 2026 වර්ෂය සඳහා බදු අයිතිය ලබා දීම සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් දේපල 2026 වර්ෂය සඳහා බදු අයිතිය ලබා දීමට, ලංසු කැඳවීම සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීමටත්, අදාල ලංසු මුදල තීරණය කිරීමත් සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි. (2025 වර්ෂයේ ටෙන්ඩර් දේපල ලබා දී ඇති ලංසු මුදල සඳහා 10% එකතු කර ඇත)

| අනු අංකය | බදු විෂයය | 2025 වර්ෂයේ අවම ලංසුව | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප මුදල (රු.ශත) | ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ඇප මුදල (රු.ශත) | පෝරම ගාස්තුව (රු.ශත) | 2025 වර්ෂයේ ටෙන්ඩර් මගින් ලබා දී ඇති මුදල(රු) | 2026 වර්ෂයේ අවම ලංසුව වෙනුවෙන් යෝජිත මුදල |
|---|---|---|---|---|---|---|---|
| 01 | පන්නෙගමුව පොදු වෙළඳපොළ සහ වැසිකිළිය | 1,648,000.00 | 50,000.00 | 5,000.00 | 5,000.00 | 1,650,000.00 | 1,815,000.00 |
| 02 | දෙබරවැව පොදු වෙළඳ පොළ සහ වැසිකිළිය | 2,081,000.00 | 50,000.00 | 5,500.00 | 5,000.00 | 2,759,650.00 | 3,035,615.00 |
| 03 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ | 368,316.66 | 5,000.00 | 1,500.00 | 500.00 | 430,000.00 | 473,000.00 |
| 04 | තිස්සමහාරාම පූජා නගර වැසිකිළිය | 138,700.00 | 1,000.00 | 750.00 | 500.00 | 155,900.00 | 171,490.00 |
| 05 | තිස්සමහාරාම බස්නැවතුම්පොළ නව වැසිකිළිය | 17,000.00 | 1,000.00 | 350.00 | 500.00 | 20,500.00 | 22,550.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 06 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ පොල් ඵලදාව (පොල් ගස් 08) | 10,020.00 | 1,000.00 | 250.00 | 500.00 | 12,002.00 | 13,202.20 |
| 07 | අකුරුගොඩ හන්දියේ වැසිකිළිය | 3,300.00 | 1,000.00 | 200.00 | 500.00 | 3,500.00 | 3,850.00 |
| 08 | තිස්සමහාරාම මාගම අක්කර 18 පොල් ඵලදාව (පොල් ගස් 07) | 2,250.00 | 1,000.00 | 200.00 | 500.00 | 2,250.00 | 2,475.00 |
| 09 | අකුරුගොඩ හන්දිය සඩ කාමර අසල නව වැසිකිළිය | 10,000.00 | 1,000.00 | 200.00 | 500.00 | 15,500.00 | 17,050.00 |
| 10 | තිස්සමහාරාම පැරණි බස්නැවතුම්පොළ පොල් ඵලදාව (පොල් ගස් 03) | 3,855.00 | 1,000.00 | 200.00 | 500.00 | 3,855.00 | 4,240.50 |

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා</u>

පහත පරිදි සංශෝධනයන් සිදුකිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.

| අනු අංකය | බදු විෂයය | 2025 වර්ෂයේ අවම ලංසුව | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප මුදල (රු.ශත) | ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ඇප මුදල (රු.ශත) | පෝරම ගාස්තුව (රු.ශත) | 2025 වර්ෂයේ ටෙන්ඩර් මගින් ලබා දී ඇති මුදල(රු) | 2026 වර්ෂයේ අවම ලංසුව වෙනුවෙන් යෝජිත මුදල(රු) |
|---|---|---|---|---|---|---|---|
| 01 | පන්නෙගමුව පොදු වෙළඳපොළ සහ වැසිකිළිය | 1,648,000.00 | 50,000.00 | 5,000.00 | 5,000.00 | 1,650,000.00 | 2,700,000.00 |
| 02 | දෙබරවැව පොදු වෙළඳ පොළ සහ වැසිකිළිය | 2,081,000.00 | 50,000.00 | 5,500.00 | 5,000.00 | 2,759,650.00 | 3,035,615.00 |
| 03 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ | 368,316.66 | 5,000.00 | 1,500.00 | 500.00 | 430,000.00 | 500,000.00 |
| 04 | තිස්සමහාරාම පූජා නගර වැසිකිළිය | 138,700.00 | 1,000.00 | 750.00 | 500.00 | 155,900.00 | 200,000.00 |
| 05 | තිස්සමහාරාම බස්නැවතුම්පොළ නව වැසිකිළිය | 17,000.00 | 1,000.00 | 350.00 | 500.00 | 20,500.00 | 100,000.00 |
| 06 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ පොල් ඵලදාව (පොල් ගස් 08) | 10,020.00 | 1,000.00 | 250.00 | 500.00 | 12,002.00 | 13,202.20 |
| 07 | අකුරුගොඩ හන්දියේ වැසිකිළිය | 3,300.00 | 1,000.00 | 200.00 | 500.00 | 3,500.00 | 3,850.00 |
| 08 | තිස්සමහාරාම මාගම අක්කර 18 පොල් | 2,250.00 | 1,000.00 | 200.00 | 500.00 | 2,250.00 | 2,475.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | එලදාව (පොල් ගස් 07) | | | | | 15,500.00 | 17,050.00 |
| 09 | අකුරුගොඩ හන්දිය කඩ කාමර අසල නව වැසිකිළිය | 10,000.00 | 1,000.00 | 200.00 | 500.00 | 3,855.00 | 4,240.50 |
| 10 | තිස්සමහාරාම පැරණි බස්නැවතුම්පොළ පොල් එලදාව (පොල් ගස් 03) | 3,855.00 | 1,000.00 | 200.00 | 500.00 | | |

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා</u>

වැසිකිළි බදු දිමෙ ලංසු මුදල් ඉහළ දැම්මක් සිදු කළහොත් ඒ සඳහා ජනතාවගෙන් අය කරන මුදල ඉහළ යාමක් සිදුවිය හැකි බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

නව වැසිකිළි ඉදිකිරිම සහ නවීකරණය සිදු කිරිමට නියමිත බවත්, එමගින් පරිහරණය කරන පුද්ගලයන් ප්‍රමාණය වැඩිකිරිමට අපේක්ෂා කරන බැවින් ජනතාවගෙන් අය කරන ගාස්තුව ඉහළ දැම්මට අපේක්ෂා නොකරන බවත් ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.ඩබලිව්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

07. <u>2025 වර්ෂයේ ඉදිරි මාස තුන සඳහා සකස් කරන ලද පරිපූරක ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරිම සඳහා වූ යෝජනාව</u>

2025 වර්ෂයේ ඉදිරි මාස තුන සඳහා සකස් කරන ලද පරිපූරක ඇස්තමේන්තුව ක්‍රියාත්මක කිරිම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| ආදායම් ඇස්තමේන්තුව | | |
|---|---|---|
| අය විෂය සංකේතය | අය විෂය නාමය | ඇස්තමේන්තු මුදල (රු.) |
| 1-63 | මුද්දර ගාස්තු | 14,776,861.00 |
| | | |
| | | 14,776,861.00 |
| | | |
| වියදම් ඇස්තමේන්තුව | | |
| වැය විෂය සංකේතය | වැය විෂය නාමය | ඇස්තමේන්තු මුදල (රු.) |
| 201-3 | වැටුප්-දෛනික හා තාවකාලික | 4,000,000.00 |
| 104-2 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 2,600,000.00 |
| 101-2 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 500,000.00 |
| 201-2 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 2,000,000.00 |
| 504-4 | විථි පහන් අළුත්වැඩියාව | 1,000,000.00 |
| 106-5 | වරිපනම් බදු කොමිස් මුදල් | 150,000.00 |

| | | |
|---|---|---|
| 103-1 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණ | 376,000.00 |
| 203-7 | ගෑස් මිලදී ගැනීම | 150,000.00 |
| 109-7 | වාහන අංගනයක් ඉදිකිරීම | 4,000,000.00 |
| | | 14,776,000.00 |
| | | |
| අතිරික්තය | | 861.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනගේවා මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

08. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් දීර්ඝ කාලයක සිට භුක්ති විඳින ලද කිරින්ද පූජා භූමි රථවාහන නැවතුම්පොළ භූමිය කඩ කාමර හිඟ මුදල කපා හැරීමට ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් දීර්ඝ කාලයක සිට භුක්ති විඳින ලද කිරින්ද පූජා භූමි රථවාහන නැවතුම්පොළ භූමිය එවක ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් කිරින්ද රජමහා විහාරයට පවරා දී ඇත.එම භූමියේ කිරින්ද පූජා භූමි රථවාහන නැවතුම්පොළ කඩ කාමර 50ක් හා කිරින්ද පොදු වෙළඳපොළ කඩ කාමර ලෙස කඩ කාමර 58 ක් ඇත.එම කඩ කාමර වලින් රුපියල් 1,622,956.00 හිඟ මුදලක් අය කර ගැනීමට තිබුණි.නමුත් එම හිඟ මුදල් අය කර ගැනීමට යාමේදී විහාරාධිපති හිමියන් ඊට විරෝධය පළ කිරීම හා කඩ හිමියන් මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කිරීම නිසා හිඟ මුදල් අය කර ගැනීමට නොහැකි වී ඇත.තවද අදාළ භූමියේ අයිතිය සභාව සතුව නොමැති බැවින් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට ද නොහැකි බැවින් හිඟ මුදල් කපා හැරීමට ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීමට 2025.08.22දින පැවති විගණන කළමණාකරන කමිටුවේදී උපදෙස් ලබා දෙන ලදී.ඒ අනුව අදාළ හිඟ මුදල කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

09. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු තිස්සමහාරාම පොදු වෙළඳපොළ කඩ අල්ලි ලෙස නම් කර ඇති ස්ථාන භෞතිකව හඳුනා ගැනීමට නොමැති එම බිල් කිරීම නිවරදි කිරීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු තිස්සමහාරාම පොදු වෙළඳපොළ කඩ අල්ලි ලෙස නම් කර ඇති ස්ථාන භෞතිකව හඳුනා ගැනීමට නොමැති බැවින් භෞතිකව නොමැති දේපළකට සිදු කළ බිල් කිරීම වැරදි බිල් කිරීමක් නිසා එය නිවරදි කර ගැනීමටත් ඒ අනුව එම කඩ අල්ලි 03 හි පවතින රුපියල් 11,866.00 හිඟ මුදල හිගයෙන් ඉවත් කිරීමටත් 2025.08.22 දින පැවති විගණන කමිටුවේදී උපදෙස් ලබා දෙන ලදී.ඒ අනුව අදාළ ලේඛන නිවරදි කිරීම සුදුසු බවත් ඒ අනුව හිඟ මුදල ඉවත් කිරීම සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි .

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.දයාසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

10. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු තිස්සමහාරාම ලොතරැයි අලෙවි කුටි ලෙස නම් කර ඇති ස්ථාන භෞතිකව හදුනා ගැනීමට නොමැති එම බිල් කිරීම නිවරදි කිරීම සදහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු තිස්සමහාරාම ලොතරැයි අලෙවි කුටි අංක0 8, 10හා 13 ලෙස නම් කර ඇති ලොතරැයි අලෙවි කුටි භෞතිකව හදුනා ගැනීමට නොමැති බැවින් භෞතිකව නොමැති දේපළකට සිදු කළ බිල් කිරීම වැරදි බිල් කිරීමක් නිසා එය නිවරදි කර ගැනීමටත් ඒ අනුව එම ලොතරැයි අලෙවි කුටි 03 හි පවතින රුපියල් 112, 620.00ක හිග මුදල හිගයෙන් ඉවත් කිරීමටත් 2025.08.22දි න පැවති විගණන කළමණාකරන කමිටුවේදි උපදෙස් ලබා දෙන ලදි.ඒ අනුව අදාළ ලේඛන නිවරදි කිරීම සුදුසු බවත් එ අනුව හිහ මුදල ඉවත් කිරීම සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

11. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව අයත් තිස්සමහාරාම පැරණි බස් නැවතුම්පළ නව කඩකාමර අංක 03 හි බදු අයිතිය ලබාදීම සදහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව අයත් තිස්සමහාරාම පැරණි බස් නැවතුම්පළ නව කඩකාමර අංක 03 හි බදු අයිතිකරු වන අයි.ජී. ප්‍රේමලාල් මහතා වෙත එම කඩකාමරය නැවත ලබාදීමට මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ නිර්දේශය හිමි වූ අතර ඒ සදහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

12. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේසේවයේ නියුතු පහත සදහන් සේවකයන්ගේ සේවා අවශ්‍යතාවය මත දිස්ත්‍රික් මිළ ගණන් යටතේ දෛනිකව ගෙවීම් කිරීම සදහා වූ යෝජනාව</u>

පහත නම් සදහන් අය 2019 මාර්තු මස සිට දිස්ත්‍රික් මිළ ගණන් යටතේ ගෙවීමේ පදනම මත මේ වන තෙක් දෛනික සේවයේ යෙදී සිටින අතර , එන්.එච්. තිලකසිරි මහතා හා එම්. අමිත් මහතා විසින් දෛනික වැටුප වැඩිකර දෙන ලෙස ඉල්ලුම් කර ඇත. එම අයට දෛනිකව ගෙවන ලද දීමනාව හා ගෙවීමට යෝජිත මුදල පිළිබද විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | නම | යොදවා ගෙන ඇති සේවාව (කාරණය) | දිස්ත්‍රික් මිළ ගණන් යටතේ ගෙවා ඇති දෛනික වැටුප | දිස්ත්‍රික් මිළ ගණන් යටතේ ගෙවීමට යෝජිත දෛනික වැටුප |
|---|---|---|---|---|
| 01 | එන්.එච්. තිලකසිරි | ආපදා කළමණාකරන මධ්‍යස්ථානය භාරකරු | රු. 1366.66 (1200.00+166.66) | දිනකට රු. 1800.00 |
| 02 | එස්. විජේරත්න | කසළ ට්‍රැක්ටරය(වීරවිල) | රු. 1366.66 (1200.00+166.66) | දිනකට රු. 1800.00 |
| 03 | එම්. අමිත් | කසළ කම්පැක්ටරය (පන්සල් පාර) | රු. 1366.66 (1200.00+166.66) | දිනකට රු. 1800.00 |

සේවා අවශ්‍යතාවය මත ඉහත සදහන් අය ඉමහත් සේවයක් ඉටු කරනු ලබන අතර , ඉහත සදහන් පරිදි දිස්ත්‍රික් මිළ ගණන් යටතේ දෛනිකව රු. 1800.00 ක් ගෙවීම සුදුසු බවට මුදල් හා

ප්‍රතිපත්ති කමිටු නිර්දේශය හිමි වී ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට මෙම ගරු මහ සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- කාර්මික සේවා කාරක සභාව මගින් ඉදිරිපත් කරන ලද යෝජනාව

13. දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රතිපාදන යටතේ තිස්සමහාරාම බස් නැවතුම්පොළ නවීකරණය කිරීම සඳහා වූ යෝජනාව

දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රතිපාදන යටතේ තිස්සමහාරාම බස් නැවතුම්පොළ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.2,317,484.20 ක ප්‍රතිපාදන අනුමත වී ඇති අතර එම ව්‍යාපෘතිය කඩිනමින් සිදු කළ යුතු බැවින් ගරු මහ සභාවේ ආවරණ අනුමැතියට යටත්ව මෙම ව්‍යාපෘතිය සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් වමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

14. දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025 වැඩසටහනේ ප්‍රාදේශීය පුස්තකාල සංවර්ධනය කිරීම යටතේ පුස්තකාලය සඳහා කොහා මෘදුකාංගය භාවිතා කිරීම සහ අදාළ උපකරණ මිලදී ගැනීම සඳහා වූ යෝජනාව

දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2025 වැඩසටහනේ ප්‍රාදේශීය පුස්තකාල සංවර්ධනය කිරීම යටතේ පුස්තකාලය සඳහා කොහා මෘදුකාංගය භාවිතා කිරීම සහ අදාළ උපකරණ මිලදී ගැනීම සඳහා මිලියන 0.5 ක ප්‍රතිපාදන හිමි වී ඇති බැවින් එම ව්‍යාපෘතිය සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.තමිලා දිල්රුක්ෂි මහත්මිය විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

15. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් ඉදිරියේ දී සිදු කිරීමට නියමිත ව්‍යාපෘතීන්ට අදාළ ඇස්තමේන්තු අනුමත කර ගැනීම සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් ඉදිරියේ දී සිදු කිරීමට නියමිත පහත දක්වා ඇති ව්‍යාපෘතීන්ට අදාළව සකස් කරන ලද ඇස්තමේන්තු සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | අරමුදල් ප්‍රභවය | ඇස්තමේන්තු මුදල (රු) |
|---|---|---|---|
| 01 | දෙබරවැව පොළ භූමියේ කාණු පද්ධතියේ කොන්ක්‍රීට් ආවරණ සකස් කිරීම | සභා අරමුදල් | 431,794.01 |
| 03 | දෙබරවැව පොදු වෙළඳපොළ වැසිකිලියට දොර සවි කිරීම | සභා අරමුදල් | 169,992.90 |
| 04 | නැදිගම්විල නවෝදා ප්‍රජා ජල ව්‍යාපෘතියට අදාළව කිරිදිඹයේ ළිදක් සකස් කර ජලය පොම්ප කර බෙදා හැරීම.( ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තු සමඟ ) | පළාත් නිශ්චිත | 4,752,901.92 |
| 05 | ඉක්කපල්ලම පාසලේ ප්‍රධාන ගේට්ටුව ඉදිරිපට ප්‍රධාන බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම | පළාත් නිශ්චිත | 5,870,075.71 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

16. බහුකාර්ය ගොඩනැගිල්ලේ වහලයේ ඉතිරි කොටස සකස් කිරීම සහ කාණු පද්ධතිය සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලංසු ඉදිරිපත් කළ කොන්ත්‍රාත් ආයතනවල ලංසු සුරක්ෂණ නිදහස් කිරීම සඳහා වූ යෝජනාව

බහුකාර්ය ගොඩනැගිල්ලේ වහලයේ ඉතිරි කොටස සකස් කිරීම සහ කාණු පද්ධතිය සකස් කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු 2025.07.22 දින පැවති මහ සභා රැස්වීමේ යෝජනා අංක 13 පරිදි තාවකාලිකව නගර කළ අතර එම ව්‍යාපෘතියේ ලංසු ඉදිරිපත් කළ ආයතනයන්හි ලංසු සුරක්ෂණයේ වලංගු කාලය 2025.09.10 දිනෙන් අවසන් වන බැවින් පහත සඳහන් කොන්ත්‍රාත් ආයතනවල ලංසු සුරක්ෂණ නිදහස් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | කොන්ත්‍රාත් ආයතනයේ නම | ලංසු සුරක්ෂණයේ වටිනාකම |
|---|---|---|
| 01 | ලේකා කන්ස්ට්‍රක්ෂන් | 200000.00 |
| 02. | රෝයල් බිල්ඩර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | 200000.00 ( බැංකු අණකරය නිදහස් කිරීම ) |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

17. යෝධකණ්ඩිය ආයුර්වේද මධ්‍යස්ථානයේ වහලය සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලංසු ඉදිරිපත් කළ ලේකා කන්ස්ට්‍රක්ෂන් ආයතනයේ ලංසු සුරක්ෂණ නිදහස් කිරීම සඳහා වූ යෝජනාව

යෝධකණ්ඩිය ආයුර්වේද මධ්‍යස්ථානයේ වහලය සකස් කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ලේකා කන්ස්ට්‍රක්ෂන් ආයතනය සමඟ ගිවිසුම්ගත වී ඇති බැවින් එම ආයතනය කාර්ය සාධන සුරක්ෂණය වන රු. 130,719.70ක මුදල ගෙවා ඇති බැවින් එම ආයතනයේ ලංසු සුරක්ෂණය වන රු.42,000.00 ක මුදල නිදහස් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

18. යෝධකණ්ඩිය ආයුර්වේද මධ්‍යස්ථානයේ වහලය සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලංසු ඉදිරිපත් කළ වික්‍රම කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් සප්ලයි ආයතනයේ ලංසු සුරක්ෂණ නිදහස් කිරීම සඳහා වූ යෝජනාව

යෝධකණ්ඩිය ආයුර්වේද මධ්‍යස්ථානයේ වහලය සකස් කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ලේකා කන්ස්ට්‍රක්ෂන් ආයතනය සමඟ ගිවිසුම්ගත වී ඇති බැවින් ලංසු ඉදිරිපත් කළ අනෙක් ආයතනය වන වික්‍රම කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් සප්ලයි ආයතනය වෙත රු.42,000.00 ක ලංසු සුරක්ෂණය නිදහස් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.කේ.නිලූකා කුමුදුනී මහත්මිය විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

19. තිස්ස නගරයේ කාණු පද්ධතිය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලංසු ඉදිරිපත් කළ ලේකා කන්ස්ට්‍රක්ෂන් ආයතනයේ ලංසු සුරක්ෂණ නිදහස් කිරීම සඳහා වූ යෝජනාව

තිස්ස නගරයේ කාණු පද්ධතිය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ලේකා කන්ස්ට්‍රක්ෂන් ආයතනය සමඟ ගිවිසුම්ගත වී ඇති බැවින් එම ආයතනය කාර්ය සාධන සුරක්ෂණය වන රු. 104,209.30 ක මුදල ගෙවා ඇති බැවින් එම ආයතනයේ ලංසු සුරක්ෂණය වන රු.32,000.00 ක මුදල නිදහස් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- <u>නිවාස හා ප්‍රජා පහසුකම් කාරක සභාව මගින් ඉදිරිපත් කරන ලද යෝජනාව</u>

20. <u>පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් දකුණු පළාත් සංවර්ධන සැලැස්ම 2025 යටතේ ආයුර්වේද විශේෂ ජංගම සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජනාව</u>

පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් දකුණු පළාත් සංවර්ධන සැලැස්ම 2025 යටතේ ආයුර්වේද විශේෂ ජංගම සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා එක් පළාත් පාලන ආයතනයකට රු.83,000.00 ක් ප්‍රතිපාදන සඳහා අනුමත වී ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

21. <u>පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් දකුණු පළාත් සංවර්ධන සැලැස්ම 2025 යටතේ පූර්ව ළමාවිය සංවර්ධනය සඳහා දරුවන්ට සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජනාව</u>

පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් දකුණු පළාත් සංවර්ධන සැලැස්ම 2025 යටතේ පූර්ව ළමාවිය සංවර්ධනය සඳහා දරුවන්ට සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් සිදු කරන ලෙස දැනුම් දී ඇත.ඒ අනුව පෙර පාසල් දරුවන් සඳහා පෝෂණීය ආහාර වේලක් ලබා දීමට එක් එක් පළාත් පාලන ආයතනයකට රු.168,000.00 ප්‍රතිපාදන අනුමත වී ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- <u>ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

22. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව යටතේ ක්‍රියාත්මක වන මහසෙන්පුර ආදාහනාගාරයට ගෑස් මිලදී මිල දී ගැනීම වෙනුවෙන් ගෙවීම කිරීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව යටතේ ක්‍රියාත්මක වන මහසෙන්පුර ආදාහනාගාරයට ගෑස් සිලින්ඩර් 07 (කිලෝග්‍රෑම 37.5) ක් මිල දී ගැනීම වෙනුවෙන් රු.124,690.98 ක මුදලක් ගෙවීම කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එල්.විරේන්ද විරාජ් මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

23. <u>ඇල්ලෙල පුහද පෙර පාසලට යාමට පවතින මාර්ගය සකස් කිරීම සඳහා වූ යෝජනාව</u>

ඇල්ලෙල පුහද පෙර පාසලට යාමට පවතින මාර්ගය වන සැරයන් වම්න්ද ප්‍රියදේව මාවත (මාර්ගයේ දිග 300 m) කැටගල් අතුරා සකස් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රත්න මහතා විසින් ස්ථිර කරනා ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

24. <u>පන්නේගමුව මහජන ක්‍රීඩාංගණය සඳහා විදුලි බල්බ යොදා විදුලි ආලෝක පද්ධතිය සකස්කර දීම වූ යෝජනාව</u>

පන්නේගමුව මහජන ක්‍රීඩාංගණය රාත්‍රී කාලයේ ආලෝකමත් කිරීම සඳහා පන්නේගමුව තරුණ සමාජය විසින් ක්‍රීඩා පිටියේ යකඩ කණු 04 ක් සකසා ඇත.එම කණු සඳහා විදුලි බල්බ යොදා විදුලි ආලෝක පද්ධතිය සකස්කර දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා විසින් ස්ථිර කරනා ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

25. <u>හොඳම පළාත් පාලන ආයතනය ලෙස තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව පත්කර ගැනීම සඳහා සියලුම මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්ගේ සහයෝගය ලබාගැනීම සඳහා වූ යෝජනාව</u>

හොඳම පළාත් පාලන ආයතනය ලෙස තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව පත්කර ගැනීම ප්‍රධාන අරමුණ පෙරදැරි කරගෙන,සිය නිවස ඉදිරිපිට,ව්‍යාපාරික ස්ථානය අවට තමන් විසින් ම පිරිසිදු කරගත යුතු බවට මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන මේ වනවිටත් ආරම්භ කළයුතු බවටත් ,ඒ සඳහා සියලුම මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්ගේ සහයෝගය ලබාගැනීම සුදුසු බවටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.පී.පුෂ්පා නිල්මිණි මහත්මිය විසින් ස්ථිර කරනා ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ.කනූජා දිලානි මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

26. <u>විරහෙල කනිටු විදුහල මායිමේ ඇති මාර්ගය සකස් කිරීම සඳහා වූ යෝජනාව</u>

විරහෙල කනිටු විදුහල මායිමේ ඇති මාර්ගය (මෙහි පයින්වත් ගමන් කළ නොහැකිය) පස් දමා පුළුල් කර ගමන් කිරීමට හැකිවන අයුරින් සකස් කර දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා විසින් ස්ථිර කරනා ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

27. <u>කුඩා ගම්මාන 07 ,විරහෙල සමූපකාරය පාර සකස් කිරීම සඳහා වූ යෝජනාව</u>

කුඩා ගම්මාන 07 ,විරහෙල සමූපකාරය පාර කොන්ක්‍රීට් කර හෝ කාපට් අතුරා සකස් කර දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.පී.සුජීවා නිල්මිණී මහත්මිය විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා

රජයෙන් ලැබෙන ප්‍රතිපාදන සඳහා යොමු කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදි.

28. කුඩා ගම්මාන 07 ,විරහෙල නිමල් අයියාගේ මෝල ඉදිරිපිට පාර සකස් කිරීම සඳහා වූ යෝජනාව

කුඩා ගම්මාන 07 ,විරහෙල නිමල් අයියාගේ මෝල ඉදිරිපිට පාර සකස් කර දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.පී.සුජීවා නිල්මිණී මහත්මිය විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

29. කාවන්තිස්සපුර රන්දි ගල් මෝල පාර සඳහා වීථි ලාම්පු ලබාගැනීම සඳහා වූ යෝජනාව

කාවන්තිස්සපුර වසමට අයත් කාවන්තිස්සපුර රන්දි ගල් මෝල පාර සඳහා වීථි ලාම්පු කිපයක් ලබාදීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.පී.සුජීවා නිල්මිණී මහත්මිය විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීවා නිල්මිණී මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනා

30. අන්දරගස්යාය ක්‍රීඩා පිටියේ ඇති කටු අන්දර ගස් ඉවත් කිරීම සඳහා වූ වූ යෝජනාව

අන්දරගස්යාය ක්‍රීඩා පිටියේ ඇති කටු අන්දර ගස් ඉවත් කර ,බොරළු අතුරා ,මායිම් වැට පිළිසකර කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හර්ෂ උදයකුමාර ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

31. අන්දරගස්යාය සුසාන භූමියේ ඇති කටු අන්දර ගස් ඉවත් කිරීම සඳහා වූ යෝජනාව

අන්දරගස්යාය සුසාන භූමියේ ඇති කටු අන්දර ගස් ඉවත් කර පිරිසිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

32. අන්දරගස්යාය වසමට අයත් පටටිවලයාය සුසාන භූමියේ ඇති කටු අන්දර ගස් ඉවත් කිරීම සඳහා වූ යෝජනාව

අන්දරගස්යාය වසමට අයත් පටටිවලයාය සුසාන භූමියේ ඇති කටු අන්දර ගස් ඉවත්කර පිරිසිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

➢ වෙනත් යෝජනා (11-8)

➢ ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා

33. තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇති කොන්ත්‍රාත් ආයතන වෙත කොන්ත්‍රාත්තුව පැවරීම සඳහා වූ යෝජනාව

පහත සඳහන් ව්‍යාපෘති සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇති කොන්ත්‍රාත් ආයතන වෙත කොන්ත්‍රාත්තුව පැවරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත් ආයතනය |
|---|---|---|
| 01 | බහුකාර්ය ගොඩනැගිල්ලේ රථවාහන නැවතුම්පොළ භූමිය කාපට් අතුරා සංවර්ධනය කිරීම සහ බිම් මහලේ අනෙකුත් අලුත්වැඩියා කටයුතු සිදු කිරීම | ලේබා කන්ස්ට්‍රක්ෂන්, හැළඹගස්වල, තිස්සමහාරාම |
| 02 | තිස්ස පූජා නගර රථවාහන නැවතුම්පොළ අසල වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම. | ලේබා කන්ස්ට්‍රක්ෂන්, හැළඹගස්වල, තිස්සමහාරාම |
| 03 | ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය ඉදිකිරීම | එස් ගෝ කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම,නො.184/2, සිරිනන්ද ජෝතිකාරාම මාවත, තලවතුගොඩ |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

34. ද්විත්ව කාර්ය කට්ටුව සේවා සැපයීම සඳහා පිටතට ලබා දීමේදී මුදල් අය කිරීම සඳහා වූ යෝජනාව

2025-09-04 දින කර්මාන්ත කමිටුවේදී තීරණය වූ පරිදි ද්විත්ව කාර්ය කට්ටුවේ වැඩ අවසන්ව ඇති අතර, එය සේවා සැපයීම සඳහා පිටතට ලබා දීමේදී මුදල් අය කිරීම සඳහා පහත පරිදි මිල ගණන් අය කිරීමට 2025-09-04 දිනැති මුදල් කමිටු නිර්දේශය හිමි වූ අතර, ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහ සභාවට යෝජනා කරමි.

පළමු 1-10 Km - රු. 8,000.00
10 Km සිට වැඩිවන කි.මී. 1 ක් සඳහා රු. 400.00

එම යෝජනාව ගරු උපසභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

35. කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ ගිනිගත් කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ලංසු ඉදිරිපත් කළ සිතිජ නිමසර කන්ස්ට්‍රක්ෂන් ආයතනයේ කාර්ය සාධන සුරක්ෂණය නිදහස් කිරීම සඳහා වූ යෝජනාව

කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ ගිනිගත් කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සිතිජ නිමසර කන්ස්ට්‍රක්ෂන් ආයතනය සමඟ ගිවිසුම්ගත වී ඇති බැවින් එම ආයතනය කාර්ය සාධන සුරක්ෂණය වන රු. 114,219.45 ක බැංකු ඇපකරයක් ඉදිරිපත් කර ඇති බැවින් එම ආයතනයේ ලංසු සුරක්ෂණය වන රු.36,000.00 ක මුදල නිදහස් කිරීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු මහ සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.කේ.නිලුකා කුමුදුනී මහත්මිය විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

36. රණකෙලිය අතුරු මාර්ගයේ බෝක්කුව සකස් කිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගැනීම සහ එම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව ප්‍රජා පාදක සංවිධානයක් වෙත පැවරීම සඳහා වූ යෝජනාව

රණකෙලිය අතුරු මාර්ගයේ බෝක්කුව සකස් කිරීමේ ව්‍යාපෘතිය සහා අරමුදලින් සිදු කිරීම සඳහා සකස් කරන ලද රු.1,315,806.15 ක වටිනාකමින් යුත් ඇස්තමේන්තුව ගරු මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන අතර එම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව ප්‍රජා පාදක සංවිධානයක් වෙත පැවරීම සුදුසු බවටද මෙම ගරු මහ සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

37. තිස්ස නගරයේ කාණු පද්ධතිය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලංසු ඉදිරිපත් කළ සිතිජ නිම්සර කන්ස්ට්‍රක්ෂන් ආයතනයේ ලංසු සුරක්ෂණ නිදහස් කිරීම සඳහා වූ යෝජනාව

තිස්ස නගරයේ කාණු පද්ධතිය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා ලේකා කන්ස්ට්‍රක්ෂන් ආයතනය සමඟ ගිවිසුම්ගත වී ඇති බැවින් ලංසු ඉදිරිපත් කළ අනෙක් ආයතනය වන සිතිජ නිම්සර කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත රු.32,000.00 ක ලංසු සුරක්ෂණය නිදහස් කිරීම සුදුසු බවට ගරු මහ සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

38. තිස්ස පූජා භූමියේ සංචාරකයින් සඳහා විවේක ගන්නා ස්ථානයක් සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලංසු ඉදිරිපත් කළ සිතිජ නිම්සර කන්ස්ට්‍රක්ෂන් ආයතනයේ ලංසු සුරක්ෂණ නිදහස් කිරීම සඳහා වූ යෝජනාව

තිස්ස පූජා භූමියේ සංචාරකයින් සඳහා විවේක ගන්නා ස්ථානයක් සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා සිතිජ නිම්සර කන්ස්ට්‍රක්ෂන් ආයතනය සමඟ ගිවිසුම්ගත වී ඇති බැවින් එම ආයතනය කාර්ය සාධන සුරක්ෂණය වන රු. 102,070.15 ක් වටිනාකමින් යුත් බැංකු ඇපකරයක් ඉදිරිපත් කර ඇති බැවින් එම ආයතනයේ ලංසු සුරක්ෂණය වන රු.30,000.00 ක මුදල නිදහස් කිරීම සුදුසු බවට ගරු මහ සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

39. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් 07 හි ගුරුවරුන් සඳහා නිල ඇඳුම් ලබාදීම වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් 07 හි ගුරුවරුන් සඳහා චක්‍රලේඛ ප්‍රකාරව නිල ඇඳුම් ලබාදීම වෙනුවෙන් රු.110,000.00 මුදලක් එච්.වී.දයා ධර්මසිලි (සචී බතික්) වෙත ගෙවීම කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

40. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව යටතේ පෙර පාසල් සඳහා දෛනික පදනම මත පෙර පාසල් ගුරුවරුන් 04 ක් බඳවා ගැනිම සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව යටතේ පෙර පාසල් 07 ක් පවතින අතර ඒ සඳහා සේවයේ යෙදෙනුයේ ගුරුභවතුන් 11 දෙනෙක් පමණි.ඒ අතර ද සක්‍රිය සේවයේ යෙදෙනුයේ නිලධාරීන් 09 දෙනෙකු පමණි. (එක් නිලධාරිනියක ප්‍රසූත නිවාඩු ලබා ඇති අතර තවත් නිලධාරිනියක් පිළිකා රෝගී තත්වයෙන් පෙළේ) සභාව යටතේ වන පෙර පාසල් තුල විශාල ගුරු හිඟයක් වේ. පෙර පාසල් තුල වන සිසු හා ගුරු වරුන් ප්‍රමාණයන් පහත පරිදි වේ.

| පෙර පාසල | ගුරුවරු සංඛ්‍යාව | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|
| පන්නෙගමුව | 1 | 30 |
| උඩුවිල | 3 | 93 |
| තිස්ස | 2 | 62 |
| පුල්පල්ලම | 1 | 24 |
| ගණේයාය | 1 | 30 |
| කිරින්ද ගොඩාන | 2 | 40 |
| උද්ධගන්දර | 1 | 33 |

2026 වර්ෂයට අදාලව ද මේ වන විට අයදුම් පත් භාර ගන්නා අතර මෙ වසරේ දරුවන් ප්‍රමාණයට වඩා ඉහල ප්‍රතිශතයක් ඇතුලත් කිරීමට අපේක්ෂිත බැවින් අනෙකුත් සම්පත් පැවතිය ද ගුරු හිඟය හේතුවෙන් දරුවන් ඇතුලත් කර ගැනිමෙ ගැටළුවක් පවති.

ඒ අනුව ග්‍රාමීය දරුවන්ගේ පූර්ව ළමා විය සංවර්ධනය සම්බන්ධව උපරිම සේවාවක් ලබා දීමට අපේක්ෂාවෙන් හා පවතින භෞතික සම්පත් පූර්ණව උපයෝගිතාවය සඳහා පලාත් පාලන කොමසාරිස්ගේ දපස/ප්‍රඅ/පපා/6/3/10 අංක හා 2025.03.26 දිනැති ලිපිය ප්‍රකාරව දෛනික පදනම මත 2026.01.01 දින සිට පෙර පාසල් ගුරුවරුන් 04 ක් බඳවා ගැනිම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

❖ අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා

මෙ සඳහා අනුමැතිය ලබා ගැනිමට පළාත් පාලන කොමසාරිස්තුමා වෙත යොමු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.උද්ධකන්දර හා කාවන්තිස්සපුර පෙර පාසල් සඳහා වැඩි දරුවන් ප්‍රමාණයක් බඳවා ගැනිමට අපේක්ෂා කරන බැවින් දැනට පවතින පෙර පාසල් ගුරුවරුන් සංඛ්‍යාවට අමතරව තවත් හතර දෙනෙකු කාර්ය මණ්ඩලයට ඇතුළත් කිරීමට අපේක්ෂා කරන බවත්, ඒ සඳහා පළාත් පාලන කොමසාරිස්තුමා සහ ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර අනුමැතිය ලබාගැනිම සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.අදාල අනුමැතිය ලබා ගැනීම සිදු කරන තෙක් මාස 06 කාලසීමාව දක්වා පුහුණු ගුරුවරු බඳවාගෙන, උද්ධකන්දර හා කාවන්තිස්සපුර පෙර පාසල් පවත්වාගෙන යාම සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

41. තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශයට අනුව පහත සඳහන් ආයතන වෙත කොන්ත්‍රාත්තුව පැවරීම සඳහා වූ යෝජනාව

පහත සඳහන් ව්‍යාපෘති සඳහා එක් ආයතනය බැගින් ලංසු ඉදිරිපත් කළ අතර තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශයට අනුව පහත සඳහන් ආයතන වෙත කොන්ත්‍රාත්තුව පැවරීම සුදුසු බවට මෙමෙ ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත් ආයතනය |
|---|---|---|
| 01 | තිස්සමහාරාම බස් නැවතුම්පොළ නවීකරණය කිරීම | සී.ජේ.කන්ස්ට්‍රක්ෂන්, නො.105, විල්මට් වීදිය, හම්බන්තොට. |
| 02 | නැදිගම්විල නවෝදා ප්‍රජා ජල ව්‍යාපෘතියට අදාළව කිරිඳිඔයේ ළිඳක් සකස් කර ජලය පොම්ප කර බෙදා හැරීම. ( ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තු සමඟ ) | එස් ෆෝ කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම,නො.184/2, සිරිනන්ද ජෝතිකාරාම මාවත, තලවකුගොඩ |

එම යෝජනාව ගරු උපසභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

42. යාන්ත්‍රික වැඩපලේ කාර්යන් සිදු කිරීම සඳහා පිටතින් සේවය ලබා ගන්නා පැස්සුම්කරුවන් දෙදෙනා සේවයෙහි යොදා ගැනීම සඳහා වූ යෝජනාව

යාන්ත්‍රික වැඩපලේ කාර්යන් සිදු කිරීම සඳහා පිටතින් සේවය ලබා ගන්නා පැස්සුම්කරුවන් දෙදෙනා ඉදිරියේදී අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා පමණක් සේවයෙහි යොදා ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

43. ඉක්කපල්ලම පාසලේ ප්‍රධාන ගේට්ටුව අසල බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ කොන්තාත්තුව පැවරීම සඳහා වූ යොජනාව

ඉක්කපල්ලම පාසලේ ප්‍රධාන ගේට්ටුව අසල බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඉදිරිපත් වූ ලංසු මේ වන විට තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත යොමු කර ඇති බැවින් කඩිනමින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ අවශ්‍යතාවය පවතින අතර එම කමිටුවේ නිර්දේශය පරිදි ගරු මහ සභාවේ ආවරණ අනුමැතියට යටත්ව සුදුසු කොන්ත්‍රාත් ආයතනයක් වෙත කොන්තාත්තුව පැවරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.දයාසේන මහතා විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

44. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ යාන්ත්‍රික වැඩපලේ කාර්යන් සිදු කර ගැනීමට පැස්සුම්කරුවකුගේ සේවය පිටතින් ලබා ගැනීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා වූ යෝජනාව.

යාන්ත්‍රික වැඩපලේ ස්ථිර සේවකයෙකු වශයෙන් සේවය කළ එම්.සුරංග ප්‍රදීප් මහතා තවමත් අසනීප තත්වයෙන් පසුවන බැවින් කොන්ත්‍රාත් පදනම මත හෝ දෛනික පදනම මත යාන්ත්‍රික වැඩපළ සඳහා පැස්සුම්කරුවෙකුගේ සේවය ලබා ගැනීමට පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

45. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් උද්ධකන්දර කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ ,අවසන් කසළ බැහැරුම් වළ තඩත්තු කිරීම සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් උද්ධකන්දර කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ ,අවසන් කසළ බැහැරුම් වළ මේ වන විට පිරිගොස් ඇති බැවින් එය තුනීකර පස් තට්ටුවකින් වසා දැමීමට අවශ්‍ය

ඊ ඇතුළත පළ කළ විදුලි කපු කණුවට [illegible] නිසා ආපදාවක් ඇතිවන [illegible] ගත් පෙර සිදුවිය හැකි බවින් මෙම [illegible] නොහැකි ඊ ඇතුළත නිසා [illegible] යෝජනා කරමි. [illegible] සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

**46. JA -6168** ට්‍රැක්ටරය සහ ටිපර් රථය අලුත්වැඩියා කිරීම සඳහා වූ යෝජනාව

නියගමගාරාම ප්‍රාදේශීය සභාවේ භාවිතයෙන් ඉවත් කර අපහරණය සඳහා වෙන් කර ඇති **JA - 6168** ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීමට සහ භාවිතයෙන් ඉවත් කර ඇති ටිපර් රථය අලුත්වැඩියා කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

**47.** රණකෙලිය ග්‍රාම නිලධාරී වසමේ යෝධකණ්ඩිය විදුහල පිවිසුම මාර්ගයේ සපත්තු බෝක්කුවක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සහ කොන්ත්‍රාත්තුව පැවරීම සඳහා වූ යෝජනාව

රණකෙලිය ග්‍රාම නිලධාරී වසමේ යෝධකණ්ඩිය විදුහල පිවිසුම මාර්ගයේ සපත්තු බෝක්කුවක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සභා අරමුදලින් සිදු කිරීම සඳහා සකස් කරන ලද රු.291,725.68 ක [illegible] ඇස්තමේන්තුව ගරු මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන අතර එම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව ප්‍රජාමූල සංවිධානයක් වෙත පැවරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

**48.** දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - **2025** යටතේ සංශෝධනය වී ඇති ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා වූ යෝජනාව

දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - **2025** යටතේ පහත සඳහන් ව්‍යාපෘතිය සංශෝධනය වී ඇති බැවින් එම ව්‍යාපෘතිය සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතියේ නාම | ඇස්තමේන්තු මුදල (රු) |
|---|---|---|
| 01 | මෝලකැප්පපතාන පාසල පිවිසුම කාපට් එක දක්වා මාර්ගය සහ ජය මාවතේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කුට්ටිගල් යොදා සංවර්ධනය කිරීම | 1,999,999.31 |

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

**49.** ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමාගේ නිවාඩු අනුමත කිරීම සඳහා වූ යෝජනාව

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.චමින්ද ජයනාත් මහතා **20205.09.25** වන දින පැවැත්වෙන සැප්තැම්බර් මස මාසික මහ සභාව වෙත සහභාගී වීමට නොහැකි බවට දැනුම් දී ඇති බවින් ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(ට) කාරක සභාවල වාර්තා සළකා බැලීම.

➢ <u>මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සභා සම්මත කිරීම</u>

2025.09.04 වන දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාවෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

➢ <u>කාර්මික සේවා කාරක සභා වාර්තාව සභා සම්මත කිරීම</u>

2025.09.04 වන දින පවත්වන ලද කාර්මික සේවා කාරක සභා වාර්තාවෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

➢ <u>පරිසර පොදු පහසුකම් කාරක සභා වාර්තාව සභා සම්මත කිරීම</u>

2025.09.03 වන දින පවත්වන ලද පරිසර පොදු පහසුකම් කාරක සභා වාර්තාවෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.තමිලා දිල්රුක්ෂි මහත්මිය විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

➢ <u>නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සභා සම්මත කිරීම</u>

2025.09.03 වන දින පවත්වන ලද නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාවෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(ඪ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා,වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.

I. <u>2025 අගෝස්තු මස ඒකාබද්ධ ලැබීම් හා ඒකාබද්ධ වියදම් සාරාංශය</u>

2025 අගෝස්තු මස ඉලක්ක ගත මාසික ආදායම රු.22,816,777.21 වන අතර සත්‍ය ආදායම රු.9,696,180.25 ද, අගෝස්තු මස ඉලක්ක ගත මාසික වියදම රු.19,226,113.41 වන අතර සත්‍ය වියදම රු.10,855,681.68 ද වන බවට ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදී.

II. <u>2025 අගෝස්තු මස හිඟ ආදායම් වාර්තාව</u>

2025 අගෝස්තු මාසය අදාළ, ආදායම් අය කර ගැනීම සහ හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශය අනුව හිඟ වරිපනම් බදු මුදල රු.3,115,749.18 ක් ද, හිඟ ව්‍යාපාර බදු මුදල රු.457,000.00 ක් ද, හිඟ කසළ බදු මුදල රු.87,900.00 ද, හිඟ යන්ත්‍රෝපකරණ කුලී රු.311,400.00 ද,හිඟ ටෙන්ඩර් මුදල් රු.216,201.51 ද,හිඟ කඩ බදු රු.4,559,064.30 ද, හිඟ විනෝද බදු රු.295,940.00 ද,හිඟ

ලිපිගොනු ගාස්තු රු.12,414.00 වන බවට ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදී.

**III. <u>2025 අගෝස්තු 01 දින සිට අගෝස්තු 31 දක්වා රු.100,000.00 ඉක්ම වූ ගෙවීම් විස්තරය ඇතුළත් වාර්තාව</u>**

| දිනය | වවුචර් අංකය | වවුචර් විස්තරය | ගෙවන ලද ආයතනය/කාටද? | මුදල රු.00 |
|---|---|---|---|---|
| 2025-08-06 | 04 | 2025 ජුලි මස කාර්ය මණ්ඩල ආදේශක/අනියම් වැටුප් ගෙවීම. | ලේකම් - තිප්‍රාස. සභා කාර්ය මණ්ඩලය | 264,921.55 |
| 2025-08-07 | 05 | 2025 ජුලි මස කාර්ය මණ්ඩල අතිකාල දීමනා ගෙවීම. | ලේකම් - තිප්‍රාස. සභා කාර්ය මණ්ඩලය | 483,255.00 |
| | 09 | තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව කසළ කටයුතු සඳහා සේවය ලබාගත් දෛනික කාර්ය මණ්ඩලය සඳහා කුලී පදනම මත වැටුප් ගෙවීම. | ලේකම් - තිප්‍රාස. සභා දෛනික කාර්ය මණ්ඩලය | 538,650.00 |
| | 10 | යාන්ත්‍රික ඒකකය මගින් නඩත්තු කටයුතු සිදුකළ අයගේ දිස්ත්‍රික් මිල ගණන් යටතේ ශ්‍රමික කුලී ගෙවීම් කිරීම. | එච්.ජී.කේ. සංජය , ජී. හර්ෂණ | 135,250.00 |
| | 25 | සඳුන්ගම මාර්ගයේ ඇති ජල කාන්දුව පැදීම සඳහා මාර්ගය පළුදු කිරීම වෙනුවෙන් රඳවාගත් ගාස්තු ගෙවීම. | සමගි ප්‍රජා සංවර්ධන කේන්ද්‍රය | 100,000.00 |
| 2025-08-11 | 27 | 2024-01-01 දින සිට 2024-12-31 දින දක්වා කාල සීමාවට විගණන ගාස්තු ගෙවීම. | විගණකාධිපති , ලංකා බැංකුවේ 7040064 ගිනුමට | 221,320.80 |
| 2025-08-11 | 32 | විදුලි අංශය සඳහා විදුලි උපකරණ මිළට ගැනීම. | චමින්ද ඉලෙක්ට්‍රිකල්ස් | 739,700.00 |
| 2025-08-18 | 49 | සභාව සතු රථවාහන සඳහා ඉන්ධන මිළට ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | ඉරේෂා පිලිං ස්ටේෂන් පුද්ගලික සමාගම | 805,802.50 |
| | 53 | 2025 ජුලි මස සභික දීමනා ගෙවීම. | ප්‍රාදේශීය සභා සභික මණ්ඩලය | 345,000.00 |
| 2025-08-21 | 56 | 2025 අගෝස්තු මස ස්ථිර කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම. | ලේකම් - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්ය මණ්ඩලය | 6,042,047.92 |
| | 59 | පොසොන් උත්සව රාජකාරී කටයුතු සඳහා සෞඛ්‍ය සේවක වැටුප් ගෙවීම. | ලේකම් , තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව | 197,100.00 |
| | 69 | චක්‍රලේඛ ප්‍රකාරව නිල ඇඳුම් ලබාදීම. | සමාධි ටේලර්ස් - එල්.කේ. වික්‍රමසිංහ | 115,200.00 |

2025 අගෝස්තු 01 දින සිට අගෝස්තු 31 දක්වා රු.100,000.00 ඉක්ම වූ, ඉහතින් දක්වා ඇති ගෙවීම් විස්තරය ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදී.

IV. 2025 අගෝස්තු 01 සිට 2025 අගෝස්තු 31 දින දක්වා සැලසුම් කමිටු අනුමැතිය ලැබී ඇති ගොනු ඇතුළත් වාර්තාව

| අනු අංකය | ලියාපදිංචි අංකය | නම හා ලිපිනය | අනුමැතිය | කමිටු දිනය |
|---|---|---|---|---|
| 01 | ත්‍රිප්‍රාස/19/SD/2025/101 | වසන්ත සාලුක දිසානායක,අංක 309,දකුණු රණකෙළිය,තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය. | 2025.08.15 |
| 02 | TPS/19/SD/2025/103 | ඩබ්.ඒ.ජයසිලි,අංක 227/2,සේනපුර, තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.08.15 |
| 03 | TPS/19/SD/2025/120 | එම්.එල්.කුරුකුලසූරිය,අංක 68B,687,දෙබරවැව, තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.08.15 |
| 04 | TPS/19/SD/2025/121 | එම්.එල්.කුරුකුලසූරිය,අංක 68B,687,දෙබරවැව ,තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.08.15 |
| 05 | TPS/19/SD/2025/123 | ඩබ්.ඒ.ඉලංගරත්න,අංක486/2A,මාලම පාර,වලගම්පත්තුව, තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.08.15 |
| 06 | TPS/19/ SD /2025/124 | වී.ඩබ්.කේ.සුමනදාස,රොෂාන්,විලමුල්ල, යෝධකණ්ඩිය, තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.08.15 |
| 07 | TPS/19/ SD /2025/126 | ඩබ්.ඒ.ජිනදාස,අංක 727,සේනපුර,තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.08.15 |
| 08 | TPS/19/ SD /2025/125 | මල්ලිකා බඩල්ගේ සනත්,අංක 143/3,අලුත්ගොඩ,තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.08.15 |
| 09 | TPS/19/SD/2025/127 | ඩී.එස්.සුදානි,අමුණුකරයාය,මාගම,තිස්සම හාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.08.15 |
| 10 | TPS/19/SD/2025/129 | ඩබ්.බී.රවිදු ලක්මාල් , ගෝණගමුව,උඩුවිල, තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.08.15 |
| 11 | TPS/19/SD/2025/130 | රතුගමගේ කල්‍යාණි,ආර්ලිස් සිල්වා මාවත,මැදවැලැන,දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.08.15 |
| 12 | TPS/19/SD/2025/131 | රතුගමගේ කල්‍යාණි,ආර්ලිස් සිල්වා මාවත,මැදවැලැන,දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.08.15 |
| 13 | TPS/19/SD/2025/132 | විදානගමගේ දයාවති,අංක 17/B,ආර්ලිස් සිල්වා මාවත, දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.08.15 |
| 14 | TPS/19/SD/2025/128 | එස්.ඒ.සුජීවා,වැලිආරගොඩ,තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.08.15 |
| 15 | TPS/19/SD/2025/106 | එස්.ඒ.සුජීවා,බර්ඩ් සිනර් හෝටලය, වැලිආරගොඩ,තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.08.15 |
| 16 | TPS/19/SD/2025/133 | ජේ.එම්.ඩබ්.සමීර සඳරුවන්,ආර් පෙදෙස,ඩී.ඩී.ගුණවර්ධන මාවත, දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.08.15 |
| 17 | TPS/19/SD/2025/134 | ඩබ්.ඒ.පී.නාගසේන,පොල්වත්ත , දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.08.21 |
| 18 | TPS/19/SD/2025/135 | ජී. ප්‍රියන්ත,අංක 95,කු.ග.11,වීරවිල | අනුබෙදුම අනුමත විය | 2025.08.21 |
| 19 | TPS/19/SD/2025/136 | පලකැටියගේ රමනී මල්කාන්ති,අංක 412,සමූපාකාර මාවත,පොල්ගහවැලැන, දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.08.21 |
| 20 | TPS/19/SD/2025/137 | එන්.ජී.කසුන්ධිර කැප්පෙටිපොළ,අංක1183,එකමුතුගම , තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.08.21 |
| 21 | TPS/19/SD/2025/138 | ආර්.එම්.සී.ධම්මිකා,රන්දුණුකැලේවත්ත, | අනුබෙදුම අනුමත | 2025.08.21 |

| | | | | |
|---|---|---|---|---|
| | | වැල්ලවායපාර,වීරවිල. | විය | |
| 22 | TPS/19/SD/2025/139 | පුබුදු වින්තක අලුත්ගෙදර,අංක 26,කොරගහ උල්පත,යෝධකණ්ඩිය, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.08.21 |
| 23 | TPS/19/ SD /2025/140 | පුබුදු වින්තක අලුත්ගෙදර,අංක 39,කොරගහ උල්පත,යෝධකණ්ඩිය, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.08.21 |
| 24 | TPS/19/ SD /2025/141 | බී.එම්.බන්දුල රත්න,අංක 43/01/C,මෝලකැපුපතාන, තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.08.21 |
| 25 | TPS/19/ SD /2025/142 | ජී.එච්.පී.යූ. ප්‍රියන්ත,"නිපුන"හැළඹගස්වල,උඩස්ගම, තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.08.26 |
| 26 | TPS/19/ SD /2025/145 | එච්.ටී.චතුරිකා රසන්ති,අංක 09,කොහොඹගහ පැලැප්ස, තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.08.26 |
| 27 | TPS/19/ SD /2025/146 | බී.එල්.නුවන්,අංක 270/1 ,සඳගිරිගම, තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.08.26 |
| 28 | තිප්‍රාස/19/අ/බෙ/2024 /196 | ජී.එච්.විජේරත්න, අංක 665, මහසෙන්පුර, තිස්සමහාරාම. | අනුබෙදුම අනුමත විය | 2025.08.26 |
| 29 | TPS/19/BA/2025/63 | අයි. ප්‍රියදර්ශනී දිසානායක,අංක 485/3,11 වන පටුමග, දෙබරවැව, තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.08.15 |
| 30 | TPS/19/BA/2025/56 | සුරංග නාමල් නානායක්කාර,අංක 236/1,රන්තරු මාවත, යෝධකණ්ඩිය, තිස්සමහාරාම. | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.08.15 |
| 31 | TPS/19/BA/2025/62 | ඒ.ඩබ්.ඒ දයාසිලි,පාදිලිගම,තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.08.21 |
| 32 | TPS/19/BA/2025/18 | කේ.බී සිරිසේන,අංක 397/2,රබර්වත්ත,තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.08.21 |
| 33 | TPS/19/BA/2025/36 | කේ.ජී.ඒ සුගත් නිලන්ත,අංක 220/22, සඳගිරි ගම,මහසෙන්පුර,තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.08.26 |
| 34 | TPS/19/BA/2025/55 | ඩබ්.ඒ ජයසිලි,අංක 227/2,සේනපුර,තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.08.26 |
| 35 | තිප්‍රාස/19/සං/අ/2024/33 TPS/19/COC/2025/24 | ජී.එස්.වයි.ද සිල්වා,සේනානායක මාවත,හැලඹගස්වල,තිස්සමහාරාම | අනුකූලතා සහතිකය ලබාදීම අනුමත විය. | 2025.08.21 |
| 36 | TPS/19/BA/2025/30 TPS/19/COC/2025/25 | ජී.එස්.වයි.ද සිල්වා,සේනානායක මාවත,හැලඹගස්වල,තිස්සමහාරාම | අනුකූලතා සහතිකය ලබාදීම අනුමත විය. | 2025.08.21 |
| 37 | තිප්‍රාස/19/සං/අ/2024/75 TPS/19/COC/2025/26 | ටී.ඩබ්.කේ සමන් කුමාර,අංක 67, දඹෙවැලැන,පන්නගමුව,වීරවිල | අනුකූලතා සහතිකය ලබාදීම අනුමත විය. | 2025.08.26 |

2025.08.01 සිට 2025.08.31 දින දක්වා සැලසුම් කමිටු අනුමැතිය ලැබී ඇති ගොනු ඇතුළත් ඉහතින් දක්වා ඇති වාර්තාව ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදි.

(ඩං) වෙනත් කරුණු.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.තමිලා දිල්රුක්ෂි මහත්මිය

නිහඩ සාහිත්‍ය සතිය පිළිබඳව සභාව දැනුවත් කිරීම සිදු කරන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් මහතා

පළාත් පාලන සතිය වෙනුවෙන් ඉතා ප්‍රයෝජනවත් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද බව සහ පවත්වන ලද ක්‍රිකට් තරඟයේ දී සියලුම දෙනා එකමුතුව සතුටින් කටයුතු කළ බවට අදහස් දක්වන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.සුනිල් පියංකර මහතා

පෙර පාසල් ගුරුවරුන් බඳවා ගැනීම පිළිබඳව විමසීම් කරමින් අදහස් දක්වන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ.තනූජා දිලානි මහත්මිය

පළාත් පාලන සතිය වෙනුවෙන් ඉතා ප්‍රයෝජනවත් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද බව සහ පවත්වන ලද ක්‍රිකට් තරඟයේ දී සියලුම දෙනා එකමුතුව සතුටින් කටයුතු කළ බවත් මෙවැනි තරඟ පැවැත්වීමෙන් සියලුමදෙනාගේ එකමුතුබව වර්ධනය වන බවට අදහස් දක්වන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා

සභාවේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙන බවට අදහස් දක්වන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හර්ෂ උදයකුමාර ජයවීර මහතා

විනෝද චාරිකාවක් අතරතුර දී මියගිය තංගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්යමණ්ඩලය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන බවත්,එළඹෙන වැසි කාලයේදි ගංවතුරට යටවිය හැකි ප්‍රදේශ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන ලෙසත්,හැකියාවක් පවතිනම් වීට් පහන් කිහිපයක් හෝ යෙදීමට අවස්ථාව ලබාදීමට අවශ්‍ය කටයුතු සලසාදෙන ලෙසත්, සභාවේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය සහයෝගය උපරිම සහයෝගය ලබාදීමට කටයුතු කරන බවටත් අදහස් දක්වන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා

විනෝද චාරිකාවක් අතරතුර දී මියගිය තංගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්යමණ්ඩලය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන බවත්, පළාත් පාලන සතිය වෙනුවෙන් සංවිධානය කරන ලද සියළුම කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය ලබාදුන් සියළු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන්ටත්,සියළු කාර්ය මණ්ඩල නිලධාරීන් සහ සෞඛ්‍ය අංශයේ සියළුම සේවක මහත්ම මහත්මීන් සඳහාත් ස්තූතිවන්ත වන බවට අදහස් දක්වන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා

විනෝද චාරිකාවක් අතරතුර දී මියගිය තංගල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්යමණ්ඩලය වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන බවත්, පළාත් පාලන සතිය සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය ලබාදුන් සියළුම මහජන නියෝජිතයන්ටත්, සියළු කාර්ය මණ්ඩල නිලධාරීන් සහ සෞඛ්‍ය අංශයේ සියළුම සේවක මහත්ම මහත්මීන් සඳහාත් ස්තූතිය පළකරන ලදී.පැතිර යමින් පවතින මත් උවදුර මැඩලීම සඳහා මේ විට මහජන ආරක්ෂක කමිටු පිහිටුවීම ආරම්භ කර ඇති බවත්, පළාත් පාලන සතිය වෙනුවෙන් පවත්වන ලද සංගීත චිකිත්සක වැඩසටහන් සඳහා සම්පත්දායකත්වය ලබාදුන් රත්මිණිතැන්න ස්ථානභාර නිලධාරී උදය නානායක්කාර මහතාට විශේෂ ස්තූතිය පළ කළ අතර ඉදිරියේ දී පැවැත්වීමට

නියමිත නිගව සාහිත්‍ය සතිය සඳහා සියළුම මන්ත්‍රීවරුන් සම්බන්ධවන ලෙසට ද අදහස් දක්වන ලදී.

අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරි මහත්මියටත්, මාධ්‍යවේදී ජේ.ජේ.ප්‍රේමසිරි මහතාටත් , රුක්මන් රත්නායක මහතාටත් ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ස්තුතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව.01.00 ට පමණ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ආර්.එම්.චතුරානි වැලිවිහාරේ,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

එච්.එල්.ජයසිරි,
සභාපති,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

එච්. එල්. ජයසිරි
සභාපති
ප්‍රාදේශීය සභාව
තිස්සමහාරාම.

2025 සැප්තැම්බර් මස 25 වන දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.